# 07 ශ්‍රේණිය - ගණිතය

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-02

## (2020- නව නිර්දේශය)



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(විවිධ පළාත් සහ පාසල් මගින් දෙවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 06ක් සහ පිළිතුරු පත්‍ර 05ක් අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# Maths 2nd Term Online Class Paper No - 01

| | |
|---|---|
| මධ්‍ය වාර්ෂික පරීක්ෂණය<br>இரண்டாம் தவணைப் பரீட்சை<br>**Mid Term Test** | 07 ශ්‍රේණිය<br>தரம் 07<br>Grade 07 |
| **ගණිතය**<br>கணிதம்<br>**Mathematics** } **I** | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two Hour |

**I - පත්‍රය**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

නම :

(01) සුළු කරන්න. 4 x 5 + 2

(02) 3g 750mg මිලි ග්‍රෑම් වලින් දක්වන්න.

(03) සුළු කරන්න. (-12) + (+5)

(04) පහත එක් එක් රූපයේ දැක්වෙන කෝණ වර්ගය නම් කරන්න.







.............................................. ..............................................

(05) ජල ටැංකියකින් මිනිත්තුවකට ජලය $5l\ 250ml$ කාන්දු වේ. මිනිත්තු 10 කින් ටැංකිය සම්පූර්ණයෙන් හිස් විය. ටැංකියේ තිබූ ජල පරිමාව සොයන්න.

(06) අරය 2.5cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න.

(07) දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කරන්න. $2\frac{1}{4}$

(08) දින 110 මාස හා දින වලින් දක්වන්න.

(09) පහත රූපවල සමමිති අක්ෂ ගණන ලියන්න.



(10) ○ තුළට අදාළ ගණිත කර්මය ද □ තුළට අදාළ සංඛ්‍යාව ද යොදන්න.

$$\frac{1}{3} \bigcirc \frac{\square}{2} = \frac{2}{6}$$

(11) හිස් තැන් පුරවන්න.

1. සුළු කෝණය $90^{o}$ ට වඩා ........................................ වේ.
2. පරාවර්ථ කෝණය $180^{o}$ ට වඩා ........................................ වේ.

(12) දී ඇති සෘජුකෝණාස්‍රයේ දිග එහි පළල මෙන් දෙගුණයක් වේ. එහි වර්ගඵලය සොයන්න.




(13) පරිමිතිය p දැක්වීම සඳහා x හා y අඩංගු ප්‍රකාශනයක් ගොඩනගන්න.




(14) දී ඇති සංඛ්‍යා අතුරින් 4න් බෙදෙන සංඛ්‍යා 2ක් තෝරා ලියන්න.

2424, 5318, 6128, 3719

(15) විහිත චතුරස්‍රය භාවිතයෙන් සමාන්තර සරල රේඛා තෝරා ලියන්න.




(16) සුළු කරන්න. 1) 0.7 x 3

2) 2.4 ÷ 2

(17) දිග 13m 23cm ක් වන කම්බියක් සමාන කැබලි 03කට කපනු ලැබේ. එක් කැබැල්ලක දිග සොයන්න.

(18) පහත රූපය ඇසුරින් සමද්විපාද ත්‍රිකෝණ 2ක් ලියා දක්වන්න.




:19* තීන්ත බඳුනක තීන්ත 1*l* 250*ml* ප්‍රමාණයක් අඩංගු වේ. එවැනි බඳුන් 5ක අඩංගු තීන්ත ප්‍රමාණය ලීටර හා මිලි ලීටර වලින් දක්වන්න.

(20) පරාවර්ත කෝණයේ අගය මැන ලියන්න.



## II - කොටස

- ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු ලියන්න.

(01) (a) A = {1ත් 10ත් අතර ප්‍රථමක සංඛ්‍යා}

(i) A හි අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියන්න. (ල. 02)

(ii) A කුලකය වෙන් රූප සටහනකින් දක්වන්න. (ල. 02)

(iii) P = { "ච ඩු ම ඩු ච" යන වචනයේ අකුරු කුලකය}

P = {ච, ඩු, ම }ලෙස ලිවිය හැක. හේතු පහදන්න. (ල. 02)

(b) (i) 48 සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවල ගුණිතයක් ලෙස ලියන්න. (ල. 03)

(ii) 18, 20 සංඛ්‍යාව කුඩා පොදු ගුණාකාරය සොයන්න. (ල. 03)

(02) (i) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| මිශ්‍ර භාග | විෂම භාග |
|---|---|
| $1\frac{3}{4}$ | |
| | $\frac{18}{7}$ |

(ල. 02)

(ii) විශාල භාගය තෝරා ලියන්න. $\frac{4}{5}$ , $\frac{4}{7}$ (ල. 02)

(iii) එකතු කරන්න. $1\frac{2}{5} + 2\frac{1}{5}$ (ල. 02)

(iv) අඩු කරන්න. $4\frac{1}{2} - 2\frac{1}{8}$ (ල. 03)

(v) කමල් තම නිවසේ සිට $1\frac{1}{2}$ km ගොස් ඉතිරි දුර වන $8\frac{1}{3}$ km බසයෙන් ගමන් කර නගරයට ළඟා වේ. කමල්ගේ නිවස නගරයේ සිට කොපමණ දුරකින් පිහිටා ඇත්ද? (ල. 03)

(03) (a) (i) එකතු කරන්න. (ල. 02)

| kg | g |
|---|---|
| 15 | 850 |
| + 3 | 780 |
| | |

(ii) ආභරණ සෑදීම සඳහා රත්රන් 8g ක ප්‍රමාණයකින් අපතේ නොයන ලෙස 40mg ක කුඩා කැබලි වලට වෙන් කළ යුතුව ඇත. වෙන් කළ හැකි කැබලි ප්‍රමාණය කොපමණද?

(ල. 03)

(b) (i) 6m 30cm හා 5m 60cm ක් දිග කම්බි කැබලි 2ක් දිග වෙනස් නොවන සේ පෑස්සීමෙන් පසුව කැබලි 5කට කපන ලදි. එක් කැබැල්ලක දිග සොයන්න. (ල. 03)

(ii) රූපයේ දැක්වෙන ලෙස සාද ඇති බිත්ති සැරසිල්ලක් වටා ඇල්ලීමට 2m ක් දිග රිබන් පටියක් අවශ්‍ය යැයි තමාලි පවසයි. ඔබ ඇයගේ ප්‍රකාශයට එකඟ වන්නේදැයි හේතු දක්වන්න. (ල. 04)




(04) (a) (i) $x = 3$, $y = 4$ විට $3x + 5y - 4$ හි අගය සොයන්න. (ල. 03)

(ii) ඇපල් ගෙඩියක මිල $x$ ද දෙඩම් ගෙඩියක මිල $y$ ද වේ. ඇපල් ගෙඩි 3ක් හා දෙඩම් ගෙඩි 4ක් මිල දී ගැනීමට වැයවන මුදල සෙවීමට වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ල. 03)

(b) (i) $2y - 7 = 9$ ගැලීම් සටහනක් මගින් විසඳීම පහත පරිදි වේ. විසඳුමට අදාළ හිස්තැන් පුරවන්න.




(ල. 04)

(ii) රූපයේ තරාදි තැටි දෙකෙහි බර සමාන වේ. $x$ කැටයක බර සොයන්න. (ල. 02)




(05) (a) (i) 64, පාදය 4 වූ දර්ශක අංකනයෙන් ලියන්න. (ල. 02)

(ii) $x = 2$ හා $y = 3$, නම් $3x^2y^2$ අගය සොයන්න. (ල. 04)

(b) (i) යා කරන්න.

| A | B |
|---|---|
| 3.12 x 10 | 0.0312 |
| 0.312 ÷ 10 | 3120 |
| 31.2 x 100 | 31.2 |

(ල. 03)

(ii) පහත දැක්වෙන දශම, භාග ලෙස ලියන්න.

| | |
|---|---|
| 0.50 | |
| 0.75 | |
| 0.125 | |

(ල. 03)

(06) (a) පහත දැක්වෙන බහු අස්‍ර භාවිතයෙන් අසා ඇති 1, 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) උත්තල බහු අස්‍ර 2ක් නම් කරන්න. (ල. 02)

(ii) සවිධි බහු අස්‍ර 3ක් නම් කරන්න. (ල. 03)

(iii) පහත ත්‍රිකෝණ කුමන වර්ගයට අයත් ත්‍රිකෝණ දැයි නම් කරන්න. (ල. 03)



.................................... .................................... ....................................

(b) (i) අරය 3cm ක් වන වෘත්තයක විෂ්කම්භය කීයද? (ල. 02)

(ii) විෂ්කම්බය 7cm ක් වන වෘත්තයක් අඳින්න. (ල. 02)

(07) (i) 5m දිග හා 4m පළල වර්ගඵලය සහිත යකඩ තහඩුවකට සමාන පරිමිතියක් සහිත සමචතුරස්‍රාකාර යකඩ තහඩුවක පැත්තක දිග සොයන්න. (ල. 05)

(ii) දිග, පළල, උස පිළිවෙලින් 1m, 20cm, 50cm උස වූ ටැංකියට දැමිය හැකි උපරිම ජල පරිමාව සොයන්න. (ල. 03)

(iii) ලීටර $1\frac{1}{2}$ $l$ ක පැණි බීම බෝතලයකින් $200ml$ ක් වූ වීදුරු කීයක් පිරවිය හැකිද? (ල. 04)

# Maths 2nd Term Online Class Paper No - 01

**දෙවන වාර පරීක්ෂණය**
**පිළිතුරු පත්‍රය**
**ගණිතය**
**07 - ශ්‍රේණිය**

**I - කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| (01) | 4 x 5 + 2<br>20 + 2<br>22 | ............ (1)<br>............ (1) (02) |
| (02) | 3750mg | 02 |
| (03) | (-7) | 02 |
| (04) | සුළු කෝණය<br>පරාවර්ත කෝණය | ............ (1)<br>............ (1) |
| (05) | 52*l* 500m*l* | ............ (1)<br>............ (1) |
| (06) |  | 02 |
| (07) | 2.25 | 02 |
| (08) | මාස 3 දින 20 | 02 |
| (09) |  | 02 |
| (10) | $\frac{1}{3} \times \frac{2}{2} = \frac{2}{6}$ | 02 |
| (11) | (i) අඩු<br>(ii) වැඩි | ............ (1)<br>............ (1) |
| (12) | දිග - 8<br>8 x 4 = 32 | ............ (1)<br>............ (1) |
| (13) | P = 2*x* + 2y | 02 |
| (14) | 2424<br>6128 | ............ (1)<br>............ (1) |
| (15) | AB<br>හා PQ 7 | 02 |

| | | |
|---|---|---|
| (16) | (i) 2.1<br>(ii) 1.2 -1 | ........ (1)<br>........ (1) |
| (17) | 4m 41cm | ........ (2) |
| (18) | ABC<br>ACD | ........ (1)<br>........ (1) |
| (19) | 6*l* 250m*l* | ........ (2) |
| (20) | නිවැරදි අගය | ........ (2) |

## II - කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| (01) | (a) (i) A = {2, 3, 5, 7} | ........ (2) |
| | (ii) A =  | ........ (2) |
| | (iii) කුලක ලිවීමේ දී එකම අවයවය දෙවරක් නොලියන බැවිනි | ........ (2) |
| | (b) (i) 2 x 2 x 2 x 2 x 3 | ........ (3) |
| | (ii) 180 | ........ (3) |
| (02) | (i) $\frac{7}{4}$ | ........ (1) |
| | $2\frac{7}{4}$ | ........ (1) |
| | (ii) $\frac{4}{5}$ | ........ (2) |
| | (iii) $3\frac{3}{5}$ | ........ (2) |
| | (iv) $\frac{9}{2} - \frac{17}{8} = \frac{36 - 17}{8} = \frac{19}{8} = 2\frac{3}{8}$ | ........ (3) |
| | (v) $1\frac{1}{2} + 8\frac{1}{3}$<br>$\frac{3}{2} + \frac{25}{3} = \frac{9 + 50}{6} = \frac{59}{6} = 9\frac{5}{6}$ | ........ (3) |
| (03) | (a) (i) 19kg 630g | ........ (2) |
| | (ii) $\frac{8000}{40} = 200$ | ........ (3) |
| | (b) (i) 6 30<br>5 60<br>11 90 $= \frac{1190}{5}$ = 2m 38cm | ........ (3) |

| | | |
|---|---|---|
| | (ii) මුළු දි. = 40 x 5 = 200cm<br>2m = 200cm<br>ඇයගේ ප්‍රකාශය සත්‍ය වේ. | .......... (4) |
| (04) | (a) (i) 3 x 3 + 5 x 4 - 4<br>9 + 20 - 4 = 25<br>(ii) $3x + 4y$<br><br>(b) (i) x2 , -7 , 16 , 8<br>(ii) $4x = 20$<br>$x = 5g$ | .......... (3)<br>.......... (3)<br><br>.......... (4)<br><br>.......... (2) |
| (05) | (a) (i) $4^3$<br>(ii) 3 x 2 x 2 x 3 x 3 = 108<br><br>(b) (i) $\frac{1}{2}$ , $\frac{3}{4}$ , $\frac{1}{8}$<br><br>(ii) නිවැරදි පිළිතුරුවලට 1 බැගින් | .......... (2)<br>.......... (4)<br><br>.......... (3)<br><br>.......... (3) |
| (06) | (a) (i) b , d , e , f ඕනෑම 2 ක්<br>(ii) d , e , f<br>(iii) සෘජුකෝණික<br>මහා කෝණික<br>සුළු කෝණික<br>(b) (i) 6cm<br>(ii) නිවැරදි රූපය | .......... (2)<br>.......... (3)<br><br>.......... (3)<br><br>.......... (2)<br>.......... (2) |
| (07) | (i) 2 (4 + 5 ) = 18m<br>18 ÷ 4 = 4.5cm<br>(ii) $\frac{100 \times 20 \times 50}{100} = 100000cm^3 = 100l$<br>(iii) $\frac{1500}{200} = 7$ | .......... (5)<br><br>.......... (3)<br><br>.......... (4) |

# Maths 2nd Term Online Class Paper No - 02

| | |
|---|---|
| මධ්‍ය වාර්ෂික පරීක්ෂණය<br>இரண்டாம் தவணைப் பரீட்சை<br>**Mid Term Test** | 07 ශ්‍රේණිය<br>தரம் 07<br>Grade 07 |
| ගණිතය<br>கணிதம்<br>**Mathematics** } I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two Hour |

**I - පත්‍රය**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

නම :

(01) සුළු කරන්න. $2 + 3 \times 6$

(02) 2g 25mg මිලි ග්‍රෑම් වලින් ලියන්න.

(03) සුළු කරන්න. $(-7) + (+3)$

(04) පහත කෝණ වර්ග නම් කරන්න.







..................................................     ..................................................

(05) ජල ටැංකියක් මිනිත්තුවකට $2l\ 500ml$ වේගයෙන් පිරෙයි. ටැංකිය සම්පූර්ණයෙන් පිරීමට මිනිත්තු 10ක් ගත වෙයි නම් ටැංකියේ ධාරිතාව සොයන්න.

(06) විෂ්කම්භය 4cm වූ වෘත්තයක් අඳින්න.

(07) $\frac{4}{5}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(08) අවු: 02 මාස 3 දින 28 දිනවලින් දක්වන්න.

(09) පහත රූපවල සමමිති අක්ෂ ගණන ලියන්න.




.................................... ....................................

(10) හිස්තැන් පුරවන්න.

$$\frac{1}{4} \times \frac{\square}{\square} = \frac{3}{12}$$

(11) හිස්තැන් පුරවන්න.

| <u>කෝණය</u> | <u>කෝණ වර්ගය</u> |
|---|---|
| $25^{o}$ | සුළු කෝණය |
| $108^{o}$ | .................................. |
| $90^{o}$ | .................................. |

(12) පහත සෘජුකෝණාස්‍රයේ දිග පළලට වඩා 10cm කින් වැඩිය. එහි වර්ගඵලය සොයන්න.



(13) පහත රූපයේ පරිමිතිය p නම් p සඳහා ප්‍රකාශනයක් $l$ හා m ඇසුරෙන් ලියන්න.




(14) දී ඇති සංඛ්‍යා අතුරෙන් 3 න් බෙදෙන සංඛ්‍යා තෝරන්න.

1342, 2013, 5121, 4003

(15) විහිත චතුරස්‍රය භාවිතයෙන් සමාන්තර රේඛා තෝරා ලියන්න.




(16) සුළු කරන්න. 1) 2.17 x 3 = .........................

2) 33.2 ÷ 4 = .........................

(17) දිග 24m 64cm වන කම්බියක් සමාන කැබලි 07 කට කැපූ විට එක් කැබැල්ලක දිග සොයන්න.

(18) දී ඇති රූපයේ සමපාද ත්‍රිකෝණ 2ක් නම් කරන්න.




(19) ජල බෝතලයක 1$l$ 25$ml$ අඩංගු වේ. එවැනි ජල බෝතල් 5ක අඩංගු ජල ප්‍රමාණය $l$ හා $ml$ වලින් සොයන්න.

(20) පරාවර්ත කෝණයේ අගය මැන ලියන්න.




## II - කොටස

- ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a) P = {6 ත් 20 ත් අතර ප්‍රථමක සංඛ්‍යා}

(i) P හි අවයව සඟල වරහන තුළ ලිවීමෙන් කුලකය ලියන්න. (ල. 02)

(ii) P කුලකය වෙන් රූපයකින් දක්වන්න. (ල. 02)

(iii) B = { "ම හ ර ග ම" යන වචනයේ ඇති අකුරු }

යන කුලකය B = { ම හ ර ග } ලෙස ලිවිය හැක. හේතු පහදන්න. (ල. 02)

(b) (i) 54 ප්‍රථමක සංඛ්‍යාවල ගුණිතයක් ලෙස ලියා දක්වන්න. (ල. 03)

(ii) 18, 20 යන සංඛ්‍යාවල කුඩා පොදු ගුණාකාරය සොයන්න. (ල. 03)

(02)(i) පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| මිශ්‍ර භාග | විෂම භාග |
|---|---|
| $2\frac{2}{3}$ | |
| | $\frac{25}{6}$ |

(ල. 02)

(ii) විශාල භාගය තෝරා ලියන්න. $\frac{5}{6}$ , $\frac{4}{5}$ (ල. 02)

(iii) අඩු කරන්න. $2\frac{2}{3} - 1\frac{1}{3}$ (ල. 02)

(iv) එකතු කරන්න. $4\frac{1}{4} + 2\frac{1}{3}$ (ල. 03)

(v) සන්දුලගේ නිවසේ සිට රෝහලට යාම සඳහා ඇති මුළු දුර $3\frac{5}{6}$ km වේ. නිවසේ සිට පා ගමනින් $1\frac{2}{3}$ km ගමන් කර ඉතිරිය බසයෙන් ගමන් කරයි. බසයෙන් ගමන් කරන දුර සොයන්න. (ල. 03)

(03) (a) (i) සුළු කරන්න. (ල. 02)

| kg | g |
|---|---|
| 47 | 226 |
| - 13 | 725 |
| | |

(ii) බෙහෙත් පෙට්ටියක 12g ලෙස සටහන් කර ඇත. එහි බෙහෙත් පෙති 20 ක් අඩංගු වේ. එක් බෙහෙත් පෙත්තක බර සොයන්න. (ල. 03)

(b) (i) 5m 40cm හා 6m 60cm ක් දිග ප්ලාස්ටික් බට 2ක් දිග වෙනස් නොවන පරිදි සම්බන්ධ කරන ලදි. ඒවා සමාන කැබලි 6කට කැපීමෙන් පසු එක කැබැල්ලක දිග සොයන්න. (ල. 03)

(ii) බිත්ති සැරසිල්ලක රාමුවක් රූපයේ දැක්වේ. එහි රාමුව වටා යකඩ පටියක් ඇල්ලීමට අවශ්‍ය වේ. ඒ සඳහා 2m යකඩ පටියක් ප්‍රමාණවත් වේ යයි සුජීවා පවසයි. ඇයගේ ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න. (ල. 04)




(04) (a) (i) $x = 2$ හා $y = 5$ විට $4y - 2x - 6$ හි අගය සොයන්න. (ල. 03)

(ii) පාසල් ආපන ශාලාවේ කඩල ඇට පාර්සලයක මිල රු. p ද, කවුපි ඇට පාර්සලයක මිල රු. m ද නම් කඩල ඇට පාර්සල් 2ක් හා කවුපි ඇට පාර්සල් 3ක් මිලදී ගැනීම සඳහා වැය වන මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ල. 03)

(b) (i) $\frac{x}{2} + 3 = 11$ ගැලීම් සටහනක් මගින් විසඳීම පහත පරිදි වේ. විසඳුමට අදළ හිස්තැන් පුරවන්න. (ල. 04)




(ii) රූපයේ දැක්වෙන තරාදියේ තබා ඇති මලුවල බර සමාන වේ. දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න. (ල. 02)




(05) (a) (i) 32, පාදය 2 වූ දර්ශක ආකාරයෙන් ලියන්න. (ල. 02)

(ii) $p = 4$ හා $q = 1$ විට $4p^2q^4$ අගය සොයන්න. (ල. 04)

(b) (i) යා කරන්න.

| A | B |
|---|---|
| 4.516 x 10 | 4.516 |
| 45.16 ÷ 10 | 451.6 |
| 4.516 x 100 | 45.16 |

(ල. 03)

(ii) දශම සංඛ්‍යා භාග ලෙස ලියන්න.

| | |
|---|---|
| 0.25 | |
| 1.5 | |
| 0.036 | |

(ල. 03)

(06) (a) පහත දී ඇති බහු අස්‍ර භාවිතයෙන් අසා ඇති i, ii, iii කොටස්වලට පිළිතුරු සපයන්න.



a b c d e f

(i) අවතල බහු අස්‍ර 2ක් නම් කරන්න. (ල. 02)

(ii) සවිධි බහු අස්‍ර 3ක් නම් කරන්න. (ල. 03)

(iii) පහත ත්‍රිකෝණ (පාද අනුව) කුමන වර්ගයට අයත්දැයි ලියන්න. (ල. 03)



.............................. .............................. ..............................

(b) හිස්තැන් පුරවන්න.

(i) කේන්ද්‍රය හරහා වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය 2 ක් යා කර අඳිනු ලබන සරල රේඛාව ................. ..................... ලෙස හඳුන්වන අතර එය ................................ මෙන් දෙගුණයක් වේ. (ල. 02)

(ii) අරය 2.5cm වන වෘත්තයක් අඳින්න. (ල. 02)

(07) (i) පැත්තක දිග 8cm වන සමචතුරස්‍රයක වර්ගඵලයට සමාන වන පරිදි සෘජුකෝණාස්‍රාකාර තහඩුවක් කපා ගත යුතුය. එහි දිග හා පළල සඳහා සුදුසු අගයන් යුගළ 2ක් ලියන්න. (ල. 05)

(ii) දිග, පළල හා උස පිළිවෙලින් 2m, 25cm සහ 40cm වන ටැංකියක් පිරවීමට අවශ්‍ය දියර කිරි ප්‍රමාණය $cm^3$ කොපමණද? (ල. 03)

(iii) $4l$ ක් වූ ටැංකියක් පිරවීමට $450ml$ ප්‍රමාණයෙන් යුත් ජල බෝතල් කොපමණ ප්‍රමාණයක් අවශ්‍ය වේද? (ල. 04)

# දෙවන වාර පරීක්ෂණය
## පිළිතුරු පත්‍රය
## ගණිතය
## 07 - ශ්‍රේණිය

**I - කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| (01) | 18 + 2<br>= 20 | 1<br>1  (02) |
| (02) | 2025mg | 02 |
| (03) | (-4) | 02 |
| (04) | පරාවර්ත කෝණය<br>සෘජු කෝණය | 1<br>1 |
| (05) | 2*l* 500m*l* x 10 = 25*l* | 1<br>1 |
| (06) |  | 02 |
| (07) | 0.8 | 02 |
| (08) | දින 848 | 02 |
| (09) |  | 02 |
| (10) | $\frac{3}{3}$ | 02 |
| (11) | $108^0$ - මහා කෝණය<br>$90^0$ - සෘජු කෝණය | 1<br>1 |
| (12) | දිග - 15cm<br>වර්ගඵලය - 15 x 5 = $75cm^2$ | 1<br>1 |
| (13) | P = 2*l* + 2m | 02 |
| (14) | 2013<br>5121 | 1<br>1 |
| (15) | PQ හා *xy* | 02 |

| | | |
|---|---|---|
| (16) | (i) 6.51<br>(ii) 8.3 | ........ (1)<br>........ (1) |
| (17) | 3m 52cm | ........ (2) |
| (18) | a, b , d | ........ (1)<br>........ (1) |
| (19) | 5*l* 125m*l* | ........ (2) |
| (20) | නිවැරදි අගයට | ........ (2) |

<u>II - කොටස</u>

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| (01) | (a) (i) P = {7, 11, 13, 17, 19} | ........ (2) |
| | (ii) P =   | ........ (2) |
| | (iii) කුලකයක එකම අවයවය දෙවරක් නොලියන බැවිනි | ........ (2) |
| | (b) (i) 2 x 3 x 3 x 3 | ........ (3) |
| | (ii) 180 | ........ (3) |
| (02) | (i) $\frac{8}{3}$ | ........ (1) |
| | $4\frac{1}{6}$ | ........ (1) |
| | (ii) $\frac{4}{5}$ | ........ (2) |
| | (iii) $\frac{8}{3} - \frac{4}{3} = \frac{4}{3} = 1\frac{1}{3}$ | ........ (2) |
| | (iv) $6 + \left(\frac{3+4}{12}\right) = 6\frac{7}{12}$ | ........ (3) |
| | (v) $3\frac{5}{6} - 1\frac{2}{3} = 2 + \left(\frac{5}{6} - \frac{4}{6}\right) = 2\frac{1}{6}$ | ........ (3) |
| (03) | (a) (i) 33kg 501g | ........ (2) |
| | (ii) 12000mg ÷ 20 = 600mg | ........ (3) |
| | (b) (i) 12m | ........ (1) |
| | 12m ÷ 6 | ........ (1) |
| | එක් කැබැල්ලක දිග 2m | ........ (1) |

| | | |
|---|---|---|
| | (ii) රාමුවේ පරිමිතිය = 2 (24 + 46) cm | ...... ① |
| | = 140cm | ...... ① |
| | 140cm < 2m එම නිසා ප්‍රමාණවත් වේ. | ...... ② |
| (04) | (a) (i) 4 x 5 - 2 x 2 - 6 | ...... ① |
| | = 20 - 4 - 6 | ...... ① |
| | = 10 | ...... ① |
| | (ii) 2p + 3m | ...... ③ |
| | (b) (i) ÷ 2 , + 3 , 8 , 16 | ...... ④ |
| | (ii) $3x = 24$ | ...... ① |
| | $x = 8$g (ඒකක අවශ්‍ය ම නොවේ) | ...... ① |
| (05) | (a) (i) 32 = 2 x 2 x 2 x 2 x 2 | ...... ① |
| | $= 2^5$ | ...... ① |
| | (ii) 4 x 42 x 14 | ...... ① |
| | = 4 x 16 x 1 | ...... ① |
| | = 64 | ...... ② |
| | (b) (i) 4.516 x 10 → 45.16<br>45.16 ÷ 10 → 4.516<br>4.516 x 100 → 451.6 | ...... ③ |
| | (ii) $\frac{25}{100}$ හෝ $\frac{1}{4}$ | ...... ① |
| | $1\frac{5}{10}$ හෝ $\frac{15}{10}$ හෝ $1\frac{1}{2}$ | ...... ① |
| | $\frac{36}{1000}$ හෝ $\frac{9}{250}$ | ...... ① |
| (06) | (a) (i) b , d | ...... ② |
| | (ii) c , e , f | ...... ③ |
| | (iii) සමද්විපාද ත්‍රිකෝණය<br>විෂමපාද ත්‍රිකෝණය<br>සමපාද ත්‍රිකෝණය | ...... ③ |
| | (b) (i) විෂ්කම්භය, අරය | ...... ② |
| | (ii)  | ② |

| | | |
|---|---|---|
| (07) | (i) වර්ගඵලය = 8 x 8 | ............ 1 |
| | = $64cm^2$ | ............ 1 |
| | 64, 1 / 32, 2 / 16, 4<br>ඕනෑම එකකට | ............ 3 |
| | (ii) 2m = 200cm | ............ 1 |
| | $200 \times 25 \times 40cm^3$ | ............ 1 |
| | $20000cm^3$<br>(ඒකක නොසලකන්න) | ............ 1 |
| | (iii) $4l = 4000ml$ | ............ 1 |
| | $4000 \div 450$ | ............ 1 |
| | ජල බෝතල් 9 | ............ 2 |

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය

**7 ශ්‍රේණිය** **ගණිතය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

01. පොත් 100 ක මිල රු. 3750.00 විය. එක් පොතක මිල සොයන්න.

02. හිස්තැන් සම්පූර්ණ කරන්න.

$$\frac{5}{4} = \square\,\frac{\square}{4}$$

03. සුළු කරන්න.

| kg | g | mg |
|---|---|---|
| 3 | 200 | 150 |
| | | x 5 |

04. 0.25 භාගයක් ලෙස දක්වන්න.

05. පහත රූපයෙහි පරිමිතිය සොයන්න.




06. හිස්තැන් සම්පූර්ණ කරන්න.




- පහත දැක්වෙන ත්‍රිකෝණ නිරීක්ෂණය කර ප්‍රශ්න අංක 07 හා 08 සඳහා පිළිතුරු සපයන්න.




07. සමද්විපාද නොවන රූපයෙහි අංකය ලියන්න.

08. සෘජුකෝණී ත්‍රිකෝණයක් වන රූපයෙහි අංකය ලියන්න.

09. එකිනෙකට වෙනස් ලෝහ වර්ග තුනකින් සෑදි කම්බි කැබලි 3 ක් එකට සම්බන්ධ කර ඒවායේ දිග $x$ හා $y$ මගින් දැක්වෙන ලෙස පහත රූපයේ සටහන් කර ඇත.




ඒ අනුව කම්බියේ මුළු දිග සඳහා වීජීය ප්‍රකාශණයක් $x$ හා $y$ ඇසුරින් ලියන්න.

10. පහත රූපයේ දී ඇති මිනුම් අනුව මුළු රූපයෙහි වර්ගඵලය සොයන්න.




11. 1200$ml$ ද්‍රව පරිමාව $l$ වලින් ලියන්න.

12. පහත දැක්වෙන රූප සටහන අනුව වගුවේ දැක්වෙන හිස්තැනට සුදුසු රේඛා ඛණ්ඩය ලියන්න.




| | |
|---|---|
| අරය | |
| විෂ්කම්භය | |

13. සුළු කරන්න.

| $l$ | $ml$ |
|---|---|
| 5 | 300 |
| | x 5 |

14. පියකු සතු මුදලින් $\frac{1}{3}$ පුතාට ද $\frac{3}{5}$ ක් දියණියට ද දුන් විට දෙදෙනාටම දුන් මුදල, මුළු මුදලින් කවර පංගුවක් ද?

15. පැත්තක දිග 5cm වන ඝණකයක පරිමාව සොයන්න.

16. $x = 2, y = 1$ වන විට, $3x - y$ හි අගය සොයන්න.

17. ආරෝහණ පිළිවෙලට සකසන්න.

$\frac{3}{10}$ , $\frac{1}{5}$ , $\frac{1}{2}$

18. අඩු කරන්න.

| | m | cm |
|---|---|---|
| | 5 | 20 |
| - | 2 | 50 |

19. භාජනයක් තුල මී පැණි 2$l$ ක් අඩංගු වේ. එම මී පැණි ප්‍රමාණය, ධාරිතාව 20$ml$ වන කුඩා බෝතල් කොපමණ සංඛ්‍යාවකට පිරවිය හැකිද?

20. සුළු කරන්න. $3\frac{1}{7} + 5\frac{2}{7}$

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.
  (පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද ලැබේ.)

---

01. (a) කවකටුව භාවිතා කරමින් පහත දැක්වෙන වෘත්ත රටා අඳින්න.

(i)  (ල.03)

(ii)  (ල.03)

(b) (i) අරය 5cm වන වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න. (ල.02)

(ii) විෂ්කම්භය AB වන පරිදි A හා B එම වෘත්තය මත පිහිටුවන්න. (ල.02)

(iii) OA රේඛාව හඳුන්වන නම කුමක් ද? (ල.02)

(iv) වෘත්තය මත C ලක්ෂ්‍යයක් ලකුණු කර ACB සම්පූර්ණ කරන්න. (ල.02)

(v) $A\hat{C}B$ අගය මැනීමෙන් එම ත්‍රිකෝණය කවර වර්ගයේ ත්‍රිකෝණයක් දැයි සඳහන් කරන්න. (ල. 02)

---

02. (a) මිනිසකු තමා සතු ඉඩමෙන් $\frac{3}{7}$ පුතාට ද, $\frac{1}{3}$ ඔහුගේ දුවට ද, ඉතිරිය තම බිරිඳට බෙදා දුන්නේ නම්,

(i) දරුවන් දෙදෙනාට හිමිවන මුළු ඉඩම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර පංගුවක් ද? (ල.03)

(ii) බිරිඳට හිමිවන ඉඩම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කවර පංගුවක් ද? (ල.02)

(b) සුළු කරන්න.

(i) $5\frac{1}{2} + 1\frac{1}{2} + \frac{5}{8}$ (ල. 04) (ii) $7\frac{1}{10} - 2\frac{3}{5}$ (ල.02)

---

03. (a) සෘජුකෝණාස්‍රයක දිග, පළල ට වඩා 5cm කින් වැඩිය.

(i) සෘජුකෝණාස්‍රයේ පළල $x$ cm ලෙස ගෙන එහි දිග සඳහා වීජීය ප්‍රකාශණයක් ලබාගන්න. (ල.03)

(ii) සෘජුකෝණාස්‍රයේ පරිමිති $x$ ඇසුරින් සොයන්න. (ල.03)

(b) (i) සුළු කරන්න. $6x - 4x + 8x$ (ල.02)

(ii) $x = 2, y = -3$ වනවිට පහත දැක්වෙන ප්‍රකාශණයෙහි අගය සොයන්න.

$5x + 2y$ (ල.03)

---

04. රූප සටහනෙහි දැක්වෙනුයේ එක්තරා වෙළෙඳසැල් ගොඩනැගිල්ලක බිම් සැලැස්මෙහි ආකෘතියකි. කඩ ඉරිවලින් දැක්වෙනුයේ ආරක්ෂිත වැටක් ගොඩනැගිල්ලට සමදුරින් පිහිටන ආකාරයයි.




(i) අඳුරු කළ රූපයේ වර්ගඵලය සොයන්න. (ල.02)

(ii) අඳුරු කළ රූපයේ වර්ගඵලය, අඳුරු නොකළ කොටසේ වර්ගඵලය මෙන් කී ගුණයක් ද? (ල.03)

(iii) ආරක්ෂිත වැටෙහි දිග හා පළල කීයද? (ල.02)

(iv) මෙම ආරක්ෂිත වැටෙහි කම්බි පොටවල් 5 ක් ගැසීමට අවශ්‍ය කම්බි වල දිග ගණනය කරන්න. (සැ.යු. - ගේට්ටුව සඳහා පළල පැත්තෙන් 3m වෙන් කළ යුතුව ඇත.) (ල.04)

05. (a) ඇපල් ගෙඩියක මිල අඹ ගෙඩියක මිලට වඩා රු. 40 කින් වැඩිය.

(i) අඹ ගෙඩිය මිල රු. $x$ ලෙස ගෙන ඇපල් ගෙඩියක මිල සොයන්න. (ල.02)

(ii) අඹ ගෙඩියක් හා ඇපල් ගෙඩියක මිලෙහි එකතුව රු. 80 ක් නම් ඒ සඳහා $x$ ඇසුරින් සමීකරණයක් ගොඩනගා $x$ හි අගය සොයන්න. (ල.04)

(b) පැන්සලක මිල රු. $x$ ද මිලදී ගත් පැන්සල් සංඛ්‍යාව $n$ ද වන විට ඒ සඳහා වැයවන මුදල ද T නම්,

(i) T, $x$, හා $n$ සම්බන්ධ වන ලෙස සූත්‍රයක් ලියන්න. (ල.02)

(ii) $x = 5$ සහ $n = 8$ නම් T හි අගය සොයන්න. (ල.02)

---

06. (a) එක්තරා දිනකදී කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් වෙත කිරි ගොවීන් 30 දෙනෙකු විසින් ගෙන එන ලද කිරි ප්‍රමාණයන් පහත සටහනෙහි දැක්වේ.

| කිරි ගොවීන් සංඛ්‍යාව | ගෙන එන ලද කිරි ප්‍රමාණය |
|---|---|
| 12 | $4l$ |
| 8 | $3l$ $750ml$ |
| 5 | $8l$ |
| 5 | $2l$ $400ml$ |

(i) කිරි ගොවීන් 30 දෙනා විසින් ගෙන එන ලද මුළු කිරි ප්‍රමාණය සොයන්න. (ල.07)

(b)




1 රූපය




2 රූපය

(i) ඉහත දැක්වෙන ඝණකාභයන්හි පරිමාව වෙන වෙනම සොයන්න. (ල.02)

(ii) එම ඝනකාභවල පරිමාවන් පිළිබඳව ඔබගේ නිගමනය කුමක් ද? (ල.02)

---

07. (a) එක්තරා පොත් වෙළඳ සැලක ප්‍රදර්ශනය කර තිබූ මිළ දර්ශණයකින් කොටසක් පහත දැක්වේ.

| වර්ගය | ඒකක මිළ රු. |
|---|---|
| පිටු 40 අභ්‍යාස පොත | 32.50 |
| පිටු 120 අභ්‍යාස පොත | 53.25 |
| ජෙල් වර්ගයේ පෑන | 13.00 |
| සාමාන්‍ය පෑන | 9.80 |

මෙම වෙළඳ සැලෙහි එක් පාරිභෝගිකයකු විසින් මිළයට ගත් ද්‍රව්‍ය පහත පරිදිය.

පිටු 40 අභ්‍යාස පොත් 10
පිටු 120 අභ්‍යාස පොත් 05
ජෙල් වර්ගයේ පෑන් 02
සාමාන්‍ය වර්ගයේ පෑන් 03

මෙම පාරිභෝගිකයා වෙළඳ සැල වෙත ගෙවන මුළු මුදල ගණනය කරන්න. (ල.05)

(b) (i) $\frac{2}{5}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ල.02)

(ii) සුළු කරන්න.

5.6    4 (ල.02)

6.023 x 100 (ල.01)

# Maths 2nd Term Online Class Paper No - 03

**07 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය** | **ගණිතය**

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | රු. 37.50 | | 02 |
| | $\frac{3750}{100}$ | 01 | |
| 02. | $1\frac{1}{4}$ | | 02 |
| 03. | kg g mg<br>16 - 750 | | 02 |
| 04. | $\frac{1}{4}$ | | 02 |
| | $\frac{25}{100}$ | 01 | |
| 05. | 36cm | | 02 |
| 06. | 19, +1 | | 02 |
| 07. | III | | 02 |
| 08. | II | | 02 |
| 09. | $2x + y$ | | 02 |
| | $x + y + x$ | 01 | |
| 10. | $36cm^2$ | | 02 |
| | $9cm^2$ | 01 | |
| 11. | $1.2l$ | | 02 |
| 12. | අරය OA<br>විෂ්කම්භය AB | | 02 |
| 13. | $l$ $ml$<br>26 500 | | 02 |
| 14. | $\frac{14}{15}$ | | 02 |
| | $\frac{1}{3} + \frac{3}{5}$ | 01 | |
| 15. | $125cm^3$ | | 02 |
| | 5 x 5 x 5 | 01 | |
| 16. | 5 | | 02 |
| | 3 x 2 - 1 | 01 | |
| 17. | $\frac{1}{5}$ , $\frac{3}{10}$ , $\frac{1}{2}$ | | 02 |
| 18. | m cm<br>2 70 | | 02 |
| 19. | 100 | | 02 |
| 20. | $8\frac{3}{7}$ | | 02 |
| | | | **40** |

### II කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | (a) | (i) | වෘත්ත රටා ඇඳීම | | 03 |
| | | (ii) | වෘත්තය | | 03 |
| | (b) | (i) | වෘත්තය ඇඳීම | | 01 |
| | | | කේන්ද්‍රය O නම් කිරීම | | 01 |
| | | (ii) | A හා B පිහිටුවීම | | 02 |
| | | (iii) | අරය | | 02 |
| | | (iv) | C ලකුණු කිරීම | | 01 |
| | | | ACB සම්පූර්ණ කිරීම | | 01 |
| | | (v) | $90^0$ සෘජුකෝණී ත්‍රිකෝණය | | 02 |
| | | | | | **16** |
| 02. | (a) | (i) | $\frac{3}{7} + \frac{1}{3}$ | | |
| | | | $\frac{9}{21} + \frac{7}{21}$ | 02 | |
| | | | $\frac{16}{21}$ | 01 | 03 |
| | | (ii) | $\frac{5}{21}$ | | 01 |
| | (b) | (i) | $(5 + 1)\ \frac{1}{2} + \frac{1}{4} + \frac{5}{8}$ | 01 | |
| | | | $6\ \frac{4}{8} + \frac{2}{8} + \frac{5}{8}$ | 01 | |
| | | | $6\ \frac{11}{8}$ | | |
| | | | $7\ \frac{4}{8}$ | 01 | |
| | | | $7\ \frac{1}{2}$ | 01 | 04 |
| | | (ii) | $7\ \frac{1}{10}$ - $2\ \frac{6}{10}$ | | |
| | | | $5\ \frac{11}{10}$ - $2\ \frac{6}{10}$ | 01 | |
| | | | $4\ \frac{5}{10}$ | 01 | |
| | | | $4\ \frac{1}{2}$ | 01 | 03 |
| | | | | | **11** |
| 03. | (a) | (i) | $x + 5$ | | 03 |
| | | (ii) | $2x + 2(x + 5)$ | | |
| | | | $2x + 2x + 10$ | | |
| | | | $4x + 10$ | | 03 |
| | (b) | (i) | $4x + 8x$ | 01 | |
| | | | $10x$ | 01 | 02 |
| | | (ii) | $5(2) + 2(-3)$ | 01 | |
| | | | $10 + (-6)$ | 01 | |
| | | | $4$ | 01 | 03 |
| | | | | | **11** |

## පිළිතුරු පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 04. | (a) | (i) | 10 x 10 | 01 | |
| | | | $100m^2$ | 01 | 02 |
| | | (ii) | 5 x 10 | 01 | |
| | | | $50m^2$ | 01 | |
| | | | දෙගුණයක් | 01 | 03 |
| | | (iii) | දිග 17m | 01 | |
| | | | පළල 12m | 01 | 02 |
| | | (iv) | 2 x 17 + 2 x 12 | 01 | |
| | | | 34 + 24 | | |
| | | | 58 | 01 | |
| | | | 58 - 3 = 55 | 01 | |
| | | | 55 x 5 = 275m | 01 | 04 |
| | | | | | **11** |
| 05. | (a) | (i) | $x + 40$ | | 02 |
| | | (ii) | $x + x + 40 = 80$ | 01 | |
| | | | $2x + 40 - 40 = 80 - 40$ | 02 | |
| | | | $\frac{2x}{2} = \frac{40}{2}$ | 01 | |
| | | | $x = 20$ | 01 | 05 |
| | (b) | (i) | T = n x $x$ | | 02 |
| | | (ii) | T = 8 x 5 | 01 | |
| | | | T = 40 | 01 | 02 |
| | | | | | **11** |
| 06. | (a) | (i) | 12 x 4 = 48$l$ | 01 | |
| | | | 3$l$ 750$ml$ x 8 | | |
| | | | 30$l$ 000$ml$ = 30$l$ | 02 | |
| | | | 5 x 8 = 40$l$ | 01 | |
| | | | 2$l$ 400$ml$ x 5 | | |
| | | | 12$l$ 000$ml$ = 12$l$ | 02 | |
| | | | 130$l$ | 01 | 07 |
| | (b) | (i) | රූපය 3 x 4 x 1 | | |
| | | | 1 12$cm^3$ | 01 | |
| | | | රූපය 2 x 3 x 2 | | |
| | | | 2 12$cm^3$ | 01 | 02 |
| | | (ii) | සමානයි | | 02 |
| | | | | | **11** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07. | (a) | (i) | 32.50 x 10 = 325.00 | | |
| | | | 53.25 x 5 = 266.25 | | |
| | | | 13 x 2 = 26.00 | | |
| | | | 9.80 x 3 = 29.40 | | |
| | | | = 646.65 | | 06 |
| | (b) | (i) | $\frac{4}{10} = 0.4$ | 02 | |
| | | (ii) | 1.4 | 02 | |
| | | | 602.3 | 01 | 05 |
| | | | | | **11** |

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

**7 ශ්‍රේණිය** **ගණිතය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

01. පහත සඳහන් භාගවලින් විෂම භාග තෝරා යටින් ඉරක් අඳින්න.

$\frac{2}{3}$ , $\frac{7}{5}$ , $1\frac{2}{3}$ , $\frac{5}{4}$ , $\frac{2}{5}$

02. 2 + 4 x 2 සුළු කරන්න.

03. 2 + (-3) සංඛ්‍යා රේඛාව ඇසුරින් අගය සොයන්න.




04. රූපයේ ඇති සියලුම ද්විපාර්ශ්වික සමමිතික අක්ෂ ඇඳ දක්වන්න.



05. මෙම රූපයේ විෂම පාද ත්‍රිකෝණයක් හා ඍජුකෝණික සමද්විපාද ත්‍රිකෝණයක් නම් කරන්න.




06. 7A ශ්‍රේණියේ සමන්තිගේ උස 145cm වේ. ඇයගේ උස මීටර්වලින් ප්‍රකාශ කරන්න.

07. සුළු කරන්න. $2a + 3b - a + b$

08. අඳුරු කර ඇති කොටසේ පරිමිතිය සොයන්න.




09. AB = 10cm ක් දිග රේඛා ඛණ්ඩයක් විෂ්කම්භය වන පරිදි ඇඳි වෘත්තයක අරය ලියන්න.

10. අවතල බහු අස්‍රයක තිබිය හැකි අවම පාද ගණන කීයද?

11. ගණක රාමුව මගින් නිරූපණය කර ඇති සංඛ්‍යාව ලියන්න.




12. A = {1 සිට 10 තෙක් 2 ගුණාකාර}
අවයව සඟල වරහන තුළ ලිවීමෙන් A කුලකය ලියා දක්වන්න.

13. ABCD මගින් දක්වා ඇත්තේ ත්‍රපීසියමකි. මෙහි ඇති සමාන්තර පාද යුගලය සංකේත යොදා රූපයේ ලකුණු කරන්න.



14. $8 = 2 \times 2 \times 2 = 2^3$
$12 = 2 \times 2 \times 3 = 2^2 \times 3$
$24 = 2 \times 2 \times 2 \times 3 = 2^3 \times 3$ වේ නම්,
8, 12, 24 හි කුඩාම පොදු ගුණාකාරය ලියන්න.

15. කවීෂාගේ උපන් දිනය 2009-04-08 වේ. අමීෂා, කවීෂාට වඩා අවුරුදු 04 යි මාස 03 යි දින 09 ක් බාල ය. අමීෂාගේ උපන් දිනය සොයන්න.

16. ලකුණු කර ඇති කෝණය නම් කරන්න.




17. ඝනකාභ හැඩැති ලී කුට්ටියක පරිමාව $100 cm^3$ කි. දිග හා පළල පිළිවෙලින් 10cm, 5cm වේ නම් එම ලී කුට්ටියේ උස සොයන්න.

18. $5l$ $50ml$ මිලිලීටර් වලින් දක්වන්න.

19. සවිධි බහුඅස්‍ර 2 ක් නම් කරන්න.

20. දී ඇති සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය A වේ. වර්ගඵලය (A) සඳහා සරල සූත්‍රයක් $x$ හා $y$ ඇසුරින් ගොඩනගන්න.



## II කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**
**(පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද ලැබේ.)**

---

01. (a) වෘත්ත පාඩම අධ්‍යයනයේදී සිදු කළ ක්‍රියාකාරකම සිහිපත් කර ගන්න.

(i) එහිදී වෘත්ත ඇඳීමට භාවිතා කළ ජ්‍යාමිතික උපකරණය නම් කරන්න. (ල.01)

(ii) එම උපකරණය භාවිතා කර අරය 3cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න. (ල.02)

(b) (i) PQ = 6cm වූ PQ සරල රේඛා ඛණ්ඩය අඳින්න. (ල.01)

(ii) P කේන්ද්‍රය වන පරිදි අරය 4cm වූ වෘත්තය අඳින්න. (ල.01)

(iii) Q කේන්ද්‍රය වන පරිදි අරය 4cm වූ වෘත්තය අඳින්න. (ල.01)

(iv) ඉහත වෘත්ත දෙක ඡේදනය වන (කැපෙන) ලක්ෂ්‍ය දෙක R සහ S ලෙස නම් කරන්න. (ල.02)

(v) අවශ්‍ය රේඛා යා කිරීමෙන් PRQ ත්‍රිකෝණයත් PSQ ත්‍රිකෝණයත් සම්පූර්ණ කරන්න. (ල.02)

(c) (i) පාද අනුව ත්‍රිකෝණ වර්ගීකරණයේ දී PRQ ත්‍රිකෝණය අයත් වන්නේ කුමන වර්ගයට ද? (ල.02)

(ii) කෝණ අනුව ත්‍රිකෝණ වර්ගීකරණයේ දී PRQ ත්‍රිකෝණය අයත් වන්නේ කුමන වර්ගයට ද? (ල.02)

(iii) PRQS චතුරස්‍රය සවිධි බහුඅස්‍රයක් බව කුමාර පවසයි. ඔහුගේ ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ල.02)

---

02. නෙළුම් හා මානෙල් දෙදෙනාට ලැබුණු චොකලට් ප්‍රමාණයන් පහත රූප වල දැක්වේ.




(i) නෙළුම්ට සහ මානෙල්ට ලැබුණු චොකලට් ප්‍රමාණ වෙන වෙනම ලියන්න. (ල.02)

(ii) නෙළුම්ට සහ මානෙල්ට ලැබුණු චොකලට් ප්‍රමාණයන් විෂම භාග ලෙස දක්වන්න. (ල.02)

(iii) දෙදෙනාටම ලැබුණු මුළු චොකලට් ප්‍රමාණය කොපමණ ද? (ල.02)

(iv) මානෙල්ට වඩා නෙළුම්ට කොපමණ චොකලට් ප්‍රමාණයක් ලැබුණේ ද? (ල.02)

(iv) මානෙල්ට ලැබුණු චොකලට් ප්‍රමාණය දශම ආකාරයෙන් දක්වන්න. (ල.03)

03. NPK පොහොර බෑගයක අඩංගු නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්, සංඝටක වල ස්කන්ධ පහත ලෙස සටහන් කර තිබුණි.




(a) (i) මෙම පොහොර බෑගයේ ඇති සංඝටකවල මුළු ස්කන්ධය සොයන්න. (ල.02)

(ii) බෑගයේ ඇති පොහොරවල අඩංගු නයිට්‍රජන් ස්කන්ධය mg වලින් ලියන්න. (ල.02)

(iii) පොහොර අසුරා ඇති බෑගයේ මුළු ස්කන්ධය 500g නම් බෑගයේ පමණක් ස්කන්ධය සොයන්න. (ල.02)

(b) සුළු කරන්න.

(i)

| g | mg |
|---|---|
| 7 | 480 |
| | x 6 |
| | |

(ල.02)

(ii) 10g 611mg ÷ 9 (ල.03)

---

04. (a)







(i) Ⓐ රූපයේ පරිමිතිය වීජීය ප්‍රකාශනයකින් දක්වන්න. (ල.01)

(ii) එම ප්‍රකාශනය සුළු කර සරලම ආකාරයෙන් ලියන්න. (ල.02)

(iii) $a = 6$ ද $b = 2$ නම් සෘජුකෝණාස්‍රයේ දිග හා පළල සඳහා අගයන් ලබා ගන්න. (ල.04)

(iv) ඉහත ඔබ ලබාගත් අගයන් ඇසුරින් Ⓑ රූපයේ වර්ගඵලය සොයන්න. (ල.01)

(b) සුළු කරන්න.

(i)

| | m | cm |
|---|---|---|
| | 7 | 65 |
| + | 2 | 25 |
| | | |

(ල.01)

(ii)

| | cm | mm |
|---|---|---|
| | 35 | 8 |
| - | 22 | 9 |
| | | |

(ල.02)

05. (a) (i) 125, පාදය 5 වූ දර්ශක අංකනයෙන් ලියන්න. (ල.02)

(ii) $3^2x^3$ යන ප්‍රකාශනය ගුණිතයක් සේ විහිදුවා ලියන්න. (ල.02)

(iii) $a^3b^2$ හි $a = 3$ ද $b = 2$ විට අගය සොයන්න. (ල.02)

(b) අගය සොයන්න.

(i) 4.52 x 10 (ල.01)

(ii) 0.875 x 6 (ල.02)

(iii) 8.94   3 (ල.02)

---

06. (a) දී ඇති අවස්ථා දෙක සඳහා සමීකරණ ගොඩ නගන්න.

(i) $x$ ට 4 ක් එකතු කළ විට ප්‍රතිඵලය 12 ක් වේ. (ල.02)

(ii) $a$ හි දෙගුණයෙන් 3 ක් අඩු කළ විට ප්‍රතිඵලය 7 වේ. (ල.02)

(b) විසඳන්න.

(i) $x + 7 = 15$ (ල.02)

(ii) $3x - 2 = 13$ (ල.02)

(c) $2x + 1 = 5$ ගැලීම් සටහනක් ඇසුරින් විසඳන්න. (ල.03)

---

07. නිවසේ ඇති මාළු ටැංකියේ දිග මැන අමාෂා සටහන් කරගත් මිනුම් රූපයේ දක්වා ඇත.




(i) මාළු ටැංකියේ පතුලේ වර්ගඵලය සොයන්න. (ල.02)

(ii) ටැංකියේ ජලය 10cm උසට පිරී තිබුණේ නම් එහි ඇති ජල පරිමාව $cm^3$ වලින් සොයන්න. (ල.02)

(iii) $1cm^3 = 1ml$ නම් ටැංකියේ ජල පරිමාව $ml$ වලින් සොයන්න. (ල.02)

(iv) ජලය නොමැති හිස් කොටසේ පරිමාව $cm^3$ වලින් සොයන්න. (ල.02)

(v) ටැංකියේ කට වටා අලංකරණය සඳහා කොළ පාටින් ගම් ටේප් එකක් ඇලවීමට අමාෂා අදහස් කරයි නම් ඇයට අවශ්‍ය ටේප් පටි වල අවම දිග ගණනය කරන්න. (ල.03)

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | $\frac{7}{5}$<br>$\frac{5}{4}$ | 01<br>01 | 02 |
| 02. | 2 + 8<br>10 | 01<br>01 | 02 |
| 03. | <br>-1 | 01<br>01 | 02 |
| 04. | 2 ක් ඇඳීම | 02 | 02 |
| 05. | PSQ<br>PQR | 01<br>01 | 02 |
| 06. | 145   100<br>1.45m | 02 | 02 |
| 07. | a + 4b | 02 | 02 |
| 08. | 16cm | 02 | 02 |
| 09. | අරය 5cm | 02 | 02 |
| 10. | 4 කි | 02 | 02 |
| 11. | 10.21 | 02 | 02 |
| 12. | A = {2, 4, 6, 8, 10} | 02 | 02 |
| 13. |  | 02 | 02 |
| 14. | $2^3 \times 3$<br>24 | 01<br>01 | 02 |
| 15. | අ   මා   දි<br>2009   04   08<br>+   4   03   09<br>2013   07   17 | 01<br>01 | 02 |
| 16. | පරාවර්ත $A\hat{B}C$ | 02 | 02 |
| 17. | $\frac{100}{10 \times 5}$<br>2 | 01<br>01 | 02 |
| 18. | 5050*ml* | 02 | 02 |
| 19. | සමචතුරස්‍රය, සමපාද   වැනි නිවැරදි පිළිතුරු 2 | 02 | 02 |
| 20. | A = *xy* | 02 | 02 |
| | | | **40** |

| | II කොටස | | |
|---|---|---|---|
| 01. | (a) (i) කවකටුව<br>(ii) නිර්මාණයට | 01<br>02 | 03 |
| | (b) (i) නිර්මාණයට<br>(ii) නිර්මාණයට<br>(iii) නිර්මාණයට<br>(iv) නම් කිරීමට<br>(v) නිර්මාණයට | 01<br>01<br>01<br>02<br>02 | 07 |
| | (c) (i) සමද්විපාද ත්‍රිකෝණ<br>(ii) මහාකෝණික ත්‍රිකෝණ<br>(iii) නැත<br>පාද සමාන වුවද කෝණ සමාන නොවන බැවින් | 02<br>02<br><br>02 | 06 |
| | | | 16 |
| 02. | (i) නෙළුම්ට - $2\frac{3}{4}$<br>මානෙල්ට - $1\frac{1}{8}$ | 01<br>01 | 02 |
| | (ii) $\frac{11}{4}$<br>$\frac{9}{8}$ | 01<br>01 | 02 |
| | (iii) $2\frac{3}{4} + 1\frac{1}{8}$<br>$(2 + 1) + \left(\frac{3}{4} + \frac{1}{8}\right)$<br>$3 + \frac{7}{8}$<br>$3\frac{7}{8}$   ඕනෑම ක්‍රමයකට | <br>01<br>01 | 02 |
| | (iv) $2\frac{3}{4} - 1\frac{1}{8}$<br>$(2 - 1) + \left(\frac{3}{4} - \frac{1}{8}\right)$<br>$1 + \frac{5}{8}$<br>$1\frac{5}{8}$ | <br>01<br><br>01 | 02 |
| | (v) $1\frac{1}{8}$<br>$1 + \frac{1}{8} \frac{\times 125}{\times 125}$<br>$1 + \frac{125}{1000}$<br>1.125 | 01<br>01<br>01<br>01 | 03 |
| | | | **11** |

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 03. | (a) (i) g mg | | |
| | 60 200 | | |
| | 120 450 | | |
| | + 300 350 | | |
| | 481 000 481g | 02 | 02 |
| | (ii) 60200mg | 02 | 02 |
| | (iii) g | | |
| | 500 | | |
| | - 481 | 01 | |
| | 19 g | 01 | 02 |
| | (b) (i) 44g 680mg | 02 | 02 |
| | (ii) 1 179 | | |
| | 9 ) 10 611 | | |
| | 9 | | |
| | 1 → 1000 | 03 | 03 |
| | 1611 | | |
| | 1611 | | |
| | 0 | | |
| | | | **11** |
| 04. | (a) (i) $x + 3 + 2x - 1 + x + 2$ | 01 | 01 |
| | (ii) $x + 2x + x + 3 - 1 + 2$ | 01 | |
| | $4x + 4$ | 01 | 02 |
| | (iii) දිග = 3a + b | | |
| | = 3 x 6 + 2 | 01 | |
| | = 20 | 01 | |
| | පළල = 2a - b | | |
| | = 2 x 6 - 2 | 01 | |
| | = 10 | 01 | 04 |
| | (iv) 20 x 10 = 200 | 01 | 01 |
| | (b) (i) 9m 90cm | 01 | 01 |
| | (ii) 12cm 9mm | 02 | 02 |
| | | | **11** |
| 05. | (a) (i) $5^3$ | 02 | 02 |
| | (ii) $3 \times 3 \times x \times x \times x \times x$ | 02 | 02 |
| | (iii) $a^3\ b^2$ | | |
| | $3^3 \times 2^2$ | 01 | |
| | 27 x 4 | 01 | |
| | 108 | | 02 |
| | (b) (i) 45.2 | 01 | 01 |
| | (ii) 5.250 | 02 | 02 |
| | (iii) 2.98 | 02 | 02 |
| | | | **11** |
| 06 | (a) (i) $x + 4 = 12$ | 02 | 02 |
| | (ii) $2a - 3 = 7$ | 02 | 02 |
| | (b) (i) $x + 7 - 7 = 15 - 7$ | 01 | |
| | $x = 8$ | 01 | 02 |
| | (ii) $3x - 2 + 2 = 13 + 2$ | 01 | |
| | $3x = 15$ | | |
| | $x = 5$ | 01 | 02 |
| | (c) නිවැරදි ගැලීම් සටහන | 01 | |
| | ප්‍රතිලෝම ගැලීම් සටහන | 01 | |
| | පිළිතුරු | 01 | 02 |
| | | | **11** |
| 07. | (i) 30 x 15 | 01 | |
| | $450cm^2$ | 01 | 02 |
| | (ii) 450 x 10 | 01 | |
| | $4500cm^3$ | 01 | 02 |
| | (iii) 4500*ml* | 02 | 02 |
| | (iv) 450 x2 | 01 | |
| | $900cm^3$ | 01 | 02 |
| | (v) පරිමිතිය = 30 + 30 + 15 + 15 | 01 | |
| | = 90cm | 01 | |
| | දිග 90cm | 01 | 03 |
| | | | **11** |

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 07 ශ්‍රේණිය

## ගණිතය

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලයඃ පැය 02 යි.**

### I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ම ලියන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගිනි)**

(1)



මෙම සමචතුරස්‍රයේ සමමිතික අක්ෂ ඇඳ දක්වන්න.

සමමිතික අක්ෂ කීයක් තිබේ ද? ..........................................................

(2) ''වඩු මඩුව'' යන වචනයේ අකුරු කුලකය සඟල වරහන් තුළ ලියා දක්වන්න.

..................................................................................................................................

(3) $P = 2$ විට $5P^3$ හි අගය සොයන්න.

..................................................................................................................................

(4) $7 + 3 \times 5$ සුළු කරන්න.

..................................................................................................................................

(5) පහත දැක්වෙන්නේ සාධක ගසකි. හිස්තැන් සම්පූර්ණ කරන්න.



(6) පහත සඳහන් වගන්ති නිවැරදි නම් ඉදිරියේ ඇති හිස් කොටුව තුළ 3 ලකුණ ද, වැරදි නම් 7 ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| ඉලක්කම් දර්ශකය 9 වන සංඛ්‍යා ඉතිරි නැතිව 9 න් බෙදේ. | |
| 624 සංඛ්‍යාව 3 න් ඉතිරි නැතිව බෙදෙයි. | |
| 414 යන සංඛ්‍යාව 4 න් ඉතිරි නැතිව බෙදෙයි. | |

(7) $\frac{4}{25}$ දශම ආකාරයෙන් ලියා දක්වන්න.

..............................................................................................................................

(8) $2 \times 2 \times P \times P \times P$ ප්‍රකාශනය දර්ශක ආකාරයෙන් ලියා දක්වන්න.

..............................................................................................................................

(9) ප. ව. 3.45 ට ආරම්භ වූ ''සූටිං මාටිං'' කාටූන් වැඩසටහන ප. ව. 4.20 ට අවසන් විය. වැඩසටහන විකාශය වූ කාලය කොපමණ ද?

..............................................................................................................................

(10)




මෙහි සමාන්තර වන පාද යුගලයක් නම් කරන්න.

..............................................................................................................................

(11) (+7) + (-2) හි අගය සොයන්න.

..............................................................................................................................

(12) ඝන වස්තුවක දාර 8 ක් හා ශීර්ෂ 5 ක් පවතී නම් එහි මුහුණත් කීය ද?

..............................................................................................................................

(13) සංඛ්‍යාවක අගය $x$ වලින් නිරූපිත ය. එම සංඛ්‍යාවේ හරි අඩකට වඩා 3 ක් අඩු සංඛ්‍යාව වීජීය ප්‍රකාශනයක් මගින් ලියා දක්වන්න.

..........................................................................................................................................................

(14)




මෙහි සමපාද ත්‍රිකෝණයක් පාට කර (අඳුරු) දක්වන්න.

(15) පහත බහු අස්‍ර උත්තල ද, අවතල ද යන්න සඳහන් කරන්න.



i. ................................ ii............................... iii. ............................... iv ...............................

(16) අරය 3 cm වන වෘත්තයක් අඳින්න.

(17) පහත ස්කන්ධ ආරෝහණ පිළිවෙලට සකස් කරන්න.

10 g,  100mg,  1kg

..........................................................................................

(18) පහත දැක්වෙන එක් එක් ත්‍රිකෝණය, සුළු කෝණී ත්‍රිකෝණයක් ද, මහා කෝණී ත්‍රිකෝණයක් ද? සෘජුකෝණී ත්‍රිකෝණයක් ද යන්න සඳහන් කරන්න.




(i) (ii) (iii) (iv)

............................................ ............................................ ............................................ ............................................

(19) $x = 3$ විට $2x - 1$ අගය සොයන්න.

..........................................................................................................................................................

(20) $162.4 \div 4$ හි අගය සොයන්න.

..........................................................................................................................................................

# II කොටස

**ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) නිමල්ගේ නිවසේ සිට පාසලට 6km 250m දුරක් ඇත.

(a) නිවසේ සිට පයින් පැමිණ 5km 470m ක් දුරක් පාසල් වෑන් රියේ ගමන් කළේ නම්, පයින් පැමිණි දුර කොපමණ ද? (ල. 03)

(b) නිමල් දින පහේම පාසල් පැමිණියේ නම් පයින් පැමිණි මුළු දුර සොයන්න. (ල. 03)

(c) අම්මා පොළට ගොස් රැගෙන ආ ද්‍රව්‍ය මෙසේ ය.

| | |
|---|---|
| සීනි | 1 kg 750g |
| කැරට් | 450g |
| පතෝල | 500g |
| කොත්තමල්ලි | 220g |
| හාල් | 5kg 400g |

මෙම බඩු මල්ලේ ස්කන්ධය සොයන්න. (ල. 03)

(d) හාල් 5kg 400g බැගින් පැකට් කර තිබුණි නම් එවැනි පැකට් 6ක ස්කන්ධය සොයන්න. (ල. 03)

---

(2) (i) $P\hat{Q}R = 45^0$ ක් වන කෝණයක් කෝණ මානය භාවිතයෙන් අඳින්න. (ල. 03)

(ii) ඉහත රූපයේ ම PQ රේඛාවට 5cm ක් දුරින් සමාන්තර රේඛාවක් නිර්මාණය කරන්න. (ල. 03)

(iii) QR රේඛාව හා සමාන්තර රේඛාව කැපෙන (ඡේදන) ලක්ෂ්‍යය S ලෙස නම් කරන්න. (ල. 03)

(iv) $Q\hat{P}S$ කෝනය මැන අගය ලියන්න. (ල. 02)

(v) QPS කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද? (ල. 01)

---

(3) (a) පහත දැක්වෙන්නේ පිට්ටනියක පිහිනුම් තටාකයක් ඉදි කර ඇති ආකාරයයි.




(i) පිට්ටනියේ පරිමිතිය සොයන්න. (ල. 01)

(ii) පිහිනුම් තටාකයේ පරිමිතිය සොයන්න. (ල. 01)

(iii) පිහිනුම් තටාකයේ වර්ගඵලය සොයන්න (ල. 01)

(iv) පිට්ටනියේ වර්ගඵලය සොයන්න (ල. 02)

(v) අඳුරු කර ඇති කොටසේ තණකොළ සිටුවීමට එහි අයිතිකරු තීරණය කර ඇත.
තණකොළ සිටුවිය යුතු වර්ගඵලය කොපමණ ද? (ල. 03)

(b)




(i) කේන්ද්‍රය නම් කරන්න. (ල. 01)

(ii) AB හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(iii) AB රේඛාව OC රේඛාව මෙන් කී ගුණයක් ද? (ල. 02)

(4) (i) 15 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස දක්වන්න. (ල. 02)

(ii) 12, 15, 24 හි මහා පොදු සාධකය සොයන්න. (ල. 03)

(iii) 9, 12, 18 සංඛ්‍යා ත්‍රිත්වයෙහි කුඩා පොදු ගුණාකාරය සොයන්න. (ල. 03)

(iv) සස්විදුට උණ සෙම්ප්‍රතිශ්‍යාව වැළඳී ඇත. ඔහු පෙ. ව. 8.00 බෙහෙත් වර්ග 03 බොන ලදී.

- A බෙහෙත් වර්ගය දවසට දෙවරක් ද
- B බෙහෙත් වර්ගය පැය 6 කට වරක් ද
- C බෙහෙත් වර්ගය පැය 4 කට වරක් ද (ල. 04)

බීමට ඇත. නැවත බෙහෙත් තුන් වර්ගයම එකවර බීමට ඇත්තේ කුමන වේලාවට ද?

---

(5) (i) $3\frac{2}{3}$ විෂම භාගයක් බවට හරවන්න. (ල. 01)

(ii) $\frac{29}{4}$ මිශ්‍ර භාගයක් ලෙස දක්වන්න (ල. 01)

(iii) <, >, = ලකුණු යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(a) $\frac{5}{8}$..................... $\frac{5}{7}$  (c) $\frac{4}{5}$....................... $\frac{2}{3}$

(b) $3\frac{1}{2}$............... $3\frac{1}{4}$  (d) $\frac{15}{9}$.................. $\frac{2}{9}$ (ල. 04)

(iv) සුළු කරන්න.

(a) $3\frac{1}{5} + 4\frac{2}{3}$  (b) $4\frac{5}{6} - 2\frac{1}{3}$ (ල. 02 × 2)

(v) 2.45 m බැගින් වූ රේන්ද කැබලි 6 ක් නිමලාට ගවුමකට ඇල්ලීමට අවශ්‍යව ඇත. මිලදී ගත යුතු රේන්ද ප්‍රමාණය කොපමණ ද? (ල. 02)

---

(6) (i) රාජ්කුමාර් ළඟ රුපියල් $x$ ඇත. හකීම් ළඟ රාජ් කුමාර් ළඟ ඇති මුදලට වඩා රුපියල් 5 ක් වැඩියෙන් ඇත. අසංක ළඟ ඇත්තේ රාජ් කුමාර ළඟ ඇති මුදල මෙන් දෙගුණයකි.

(a) හකීම් ළඟ ඇති මුදල $x$ ඇසුරෙන් ලියන්න. (ල. 02)

(b) අසංක ළඟ ඇති මුදල $x$ ඇසුරෙන් ලියන්න. (ල. 02)

(c) තිදෙනාම ළඟ ඇති මුදල $x$ ඇසුරෙන් ලියන්න. (ල. 02)

(d) රාජ් කුමාර් ළඟ රු. 10 ක් තිබුණි නම් තිදෙනා ළඟ ඇති මුදල් වෙන වෙන ම සොයන්න. (ල.03)

(ii) $8P + 7 = 79$ විසඳන්න. (ල. 03)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 07 ශ්‍රේණිය

## ගණිතය - පිළිතුරු පත්‍රය

### I කොටස

එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින් වේ.

(1)



4 යි

(2) {ච, ඩු, ම}

(3) $5 \times 8 = 40$

(4) 22

(5) P = 6, Q = 30, R = 3

(6) 3 3 7 දෙකක් හරි නම් ලකුණු 1 දෙන්න.

(7) 0, 16

(8) $2^2 \times P^3 = 4P^3$

(9) මි. 35

(10) AB හා DC
AD හා BC

(11) +5

(12) 5

(13) $\frac{x}{2} - 3$

(14)



(15) උත්තල, අවතල, උත්තල, අවතල

(16) -

(17) 100mg, 10g, 1kg

(18) ඍජුකෝණී Δ ,
මහා කෝණී Δ ,
සුළු කෝණී Δ ,
සුළු කෝණී Δ

(19) 5

(20) 40.6 (ලකුණු 2 x 20 = 40)

### II කොටස

(1) a)

| Km | m |
|---|---|
| 6 | 250 |
| 5 | 470 |
| 0 | 780 m |

(2)

b) $780 \text{ m} \times 10$ (1)
7800 m = 7km 800m (3)

c) 8 kg 320g (3)

d) $5 \text{ kg } 400\text{g} \times 6$ (1)
32 kg 400g (2)

(2)




(3) a) (i) 12 + 10 + 12 + 10 m = 44m
(ii) 5m + 5 m + 5 m+ 5m = 20 m
(iii) $5 \times 5\text{m}^2 = 25 \text{ m}^2$
(iv) $12 \times 10 = 120\text{m}^2$
(v) $120\text{m}^2 - 25\text{m}^2 = 95 \text{ m}^2$

b) (i) O
(ii) විෂ්කම්භය
(iii) දෙගුණයක්

(4) (i) $3 \times 5$
(ii) ම. පො. ස. 3
(iii) කු. පො. ගු. 36
(iv) පැය 12 ක ට පසු
ප. ව. 8.00 ට

(5) (i) $\frac{11}{3}$

(ii) $7\frac{1}{4}$

(iii) a) <
c) >
b) >
d) >

(iv) a) $3\frac{1}{5}+4\frac{2}{3}$

$7\left(\frac{3}{15}+\frac{10}{15}\right)$

$7\frac{13}{15}$

b) $4\frac{5}{6}-2\frac{1}{3}$

$2\left(\frac{5}{6}-\frac{1}{3}\right)$

$2\left(\frac{5}{6}-\frac{2}{6}\right)$

$2\frac{3}{6} = 2\frac{1}{2}$

(iv) 2.45m $\times$ 6
14.70 m

(6) (i) a) $x + 5$
b) $2x$
c) $x + x + 5 + 2x$
$4x + 5$
d) රාජ් කුමාර් රු. 10
හකීම් රු. 15
අසංක රු. 20

(ii) 8P + 7 = 79
8P = 72
P = 9

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර ඇගයීම

7 ශ්‍රේණිය | විෂයය : ගණිතය | කාලය : පැය 2.00 යි

නම : ........................................................................................................................................

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 2 බැගින් හිමි වේ.

01. A = {50250 යන සංඛ්‍යාවේ ඉලක්කම්}
    A හි අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් A කුලකය ලියා දක්වන්න.

02. අගය සොයන්න. $6 + 4 \div 2$

03. 18 හි සාධක සියල්ල ලියන්න.

04. $a = 2$, $b = 3$ වන විට $ab^2$ හි අගය සොයන්න.

05. අඩු කරන්න.

| | මාස | දින |
|---|---|---|
| | 5 | 12 |
| - | 2 | 23 |

06. එකතු කරන්න. (-2) + (+8)

07. AB හා BC බාහු වන සුළු කෝණයක් අඳින්න.

08. 6, 8, 12 යන සංඛ්‍යාවල කුඩා ම පොදු ගුණාකාරය සොයන්න.

09. ක්‍රි.ව. 2000-10-30 දිනය අයත් වන දශකය ලියන්න.

10. එකතු කරන්න.

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 2 | 06 | 20 |
| + | 3 | 07 | 15 |
| | | | |

11. 12 ☐ 4 යනු හයෙන් හරියට ම බෙදෙන ඉලක්කම් හතරකින් යුත් සංඛ්‍යාවකි.
හිස් කොටුවට ගැලපෙන ඉලක්කමක් ලියන්න.

12. සමපාද ත්‍රිකෝණයකට සමමිති අක්ෂ කීයක් තිබේද?

13. පහත ගුණිතය දර්ශක අංකනයෙන් ලියන්න.

$5 \times 5 \times a \times 5 \times a$

14. පහත සඳහන් භාගවලින් විෂම භාග තෝරා යටින් ඉරක් අඳින්න.

$\frac{7}{9}, \quad \frac{5}{5}, \quad \frac{2}{3}, \quad \frac{6}{5}, \quad \frac{4}{9}$

15. < හෝ > හෝ = හෝ යන සංකේත අතුරින් සුදුසු සංකේතය හිස්තැනට යොදන්න.

$3\frac{1}{4}$ ............... $3\frac{3}{8}$

16. පහත දැක්වෙන භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

$\frac{3}{5}$

17. හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න. $62.1 \div$ ............ $= 6.21$

18. සුළු කරන්න. $\frac{1}{6} + \frac{5}{12}$

19. p මගින් සංඛ්‍යාවක් දැක්වේ. p ට වඩා a ප්‍රමාණයක් අඩු සංඛ්‍යාවක් p හා a මගින් ලියන්න.

20. මිලිග්‍රෑම්වලින් ලියන්න. 3g 125 mg

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 11 බැගින් ද හිමි වේ.

---

**01.** (a) නේවාසිකාගාරයක සිටින සෑම පිරිමි ළමයෙකුට ම අලුත්, කලිසමක් හා කමිසයක් ලබා දීමට නියමිතය. ඒ පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| එක් ළමයෙකුට වැය වන රෙදි ප්‍රමාණය (m) | | ළමයි සංඛ්‍යාව | රෙදි 1 m ක මිල (රු.) | |
|---|---|---|---|---|
| කලිසමකට | කමිසයකට | | කලිසම් | කමිස |
| 2.25 | 1.5 | 40 | 200 | 150 |

නේවාසිකාගාරයේ සිටින පිරිමි ළමයි සියළු දෙනාට ම,

(i) කමිස මැසීමට අවශ්‍ය කරන මුළු රෙදි ප්‍රමාණය සොයන්න.

(ii) කලිසම් මැසීමට අවශ්‍ය කරන මුළු රෙදි ප්‍රමාණය සොයන්න.

(iii) ඇඳුම් මැසීමට, රෙදි සඳහා යන මුළු වියදම සොයන්න.

(b) පලතුරු වෙළෙන්දෙක්,

- අඹ ගෙඩියක් රු. a බැගින් ද, අන්නාසි ගෙඩියක් රු. b බැගින් ද මිල දී ගනියි.
- අඹ ගෙඩියක් මිල දී ගන්නා මුදල මෙන් දෙගුණයක මිලකට, අඹ ගෙඩියක් අලෙවි කරයි.
- අන්නාසි ගෙඩියක් මිල දී ගන්නා මුදල මෙන් තුන් ගුණයට තවත් රු. 5 ක් එකතු කර ලැබෙන මුදලට, අන්නාසි ගෙඩියක් අලෙවි කරයි.

(i) අඹ ගෙඩියක් විකුණන මිල a ඇසුරින් ලියන්න.

(ii) අන්නාසි ගෙඩියක් විකුණන මිල b ඇසුරින් ලියන්න.

(iii) නිමල් එම වෙළෙන්දාගෙන් අඹ ගෙඩි 3 ක් හා අන්නාසි ගෙඩියක් මිල දී ගනියි. නිමල්ට වැය වන මුළු මුදල a හා b ඇසුරින් ලියා එය සරල ආකාරයෙන් දක්වන්න.

**02.** (a) සුළු කරන්න. පිළිතුර සරල ව දක්වන්න.

(i) $\frac{5}{6} + \frac{1}{4}$ (ii) $\frac{7}{8} - \frac{5}{6}$ (iii) $1\frac{1}{2} + 2\frac{1}{3}$

(b) මිනිසෙකු සතු ඉඩමක විශාලත්වය හෙක්ටයාර 2 කි. ඔහු ඉන් හෙක්ටයාර $1\frac{1}{4}$ ක් තම පුතුට දෙන ලදි. ඔහුට ඉතිරි වූ බිම් ප්‍රමාණය සොයන්න.




**03.** රූපයේ දී ඇති දත්ත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සෘජුකෝණී ත්‍රිකෝණයක් නම් කරන්න.

(ii) විෂම ත්‍රිකෝණයක් නම් කරන්න.

(iii) සවිධි බහුඅස්‍රයක් නම් කරන්න.

(iv) AB = 8 cm, BC = 6 cm, AC = 10 cm නම් ABCD චතුරස්‍රයේ පරිමිතිය සොයන්න.

(v) ABCD උත්තල බහුඅස්‍රයක් බව නිමල් කියයි. ඔබ නිමල් හා එකඟද? හේතුව ලියන්න.

**04.** (a) විසඳන්න. (i) $x + 2 = 3$

(ii) $3x - 4 = 8$

(b) පහත දී ඇති ප්‍රකාශය සඳහා සරල සමීකරණයක් ගොඩනගන්න.

එකක් රු. a වූ පොත් 4 ක් හා එකක් රු. 10 බැගින් වූ පැන්සල් 3 ක් මිල දී ගැනීමට රු. 110 ක් වැය විය.

(c) භාණ්ඩ ප්‍රවාහනය කරන ලොරි රථයක් කිලෝග්‍රෑම් එකක ස්කන්ධයක් ප්‍රවාහනය කිරීමට රු. n මුදලක් අය කරයි. ප්‍රවාහනය කරන මුළු භාණ්ඩ ප්‍රමාණයේ ස්කන්ධය කිලෝග්‍රෑම් m වේ. එම භාණ්ඩ ප්‍රමාණය ප්‍රවාහනය සඳහා අය කළ මුළු මුදල රු. p වේ.

(i) p සඳහා සූත්‍රයක් m හා n ඇසුරින් ලියන්න.

(ii) $n = 10, m = 250$ නම් p හි අගය සොයන්න.

**05.** (a) සෘජුකෝණාස්‍රයක වර්ගඵලය 36 $cm^2$ වේ. එහි දිග හා පළල සඳහා තිබිය හැකි අගය යුගල දෙකක් ලියන්න.

(b) ABCD සෘජුකෝණාස්‍රාකාර බිම් කඩකි. එහි ඇතුළතින් වටේට ම 2 m පළලට තණකොළ වවා ඇත. (අඳුරු කළ කොටස) ඉතිරි කොටසේ මල් වවා ඇත.




(i) බිම් කඩෙහි (ABCD) වර්ගඵලය සොයන්න.

(ii) මල් වැවූ කොටසේ දිග හා පළල සොයන්න.

(iii) තණකොළ වැවූ කොටසේ වර්ගඵලය සොයන්න.

**06.** (a) ඝනකාභ හැඩැති පෙට්ටියක දිග, පළල හා උස පිළිවෙළින් 1.2 m, 0.9 m හා 75 cm වේ. එම පෙට්ටියේ පරිමාව ඝන සෙන්ටිමීටරවලින් සොයන්න.

(b) ඝනකාභ හැඩැති පෙට්ටියක පරිමාව 192 $cm^3$ වේ. එහි දිග 8 cm ක් ද, උස 4 cm ක් ද වේ. පළල සොයන්න.

(c) රූපයේ දී ඇති අක්ෂර ඇසුරින්, වෘත්තයේ

(i) කේන්ද්‍රය (ii) අරය (iii) විෂ්කම්භය ලියා දක්වන්න.




(d) විෂ්කම්භය 8 cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න.

**07.** (i) ගුණ කරන්න. 12 g 75 mg x 12

(ii) බෙදන්න. 3 kg 750 g ÷ 6

(iii) බිත්ති සැරසිල්ලක් සඳහා පීත්ත පටි කැබලි 7 ක් අවශ්‍ය වේ. එක් කැබැල්ලක දිග 8 cm 6 mm ක් වේ. කැබලි සියල්ලේ ම දිග සොයන්න.

(iv) එකම වර්ගයේ කොඩි 8 ක් මැසීමට රෙදි 5 m 8 cm යොදා ගන්නා ලදි. එක් කොඩියක් මැසීම සඳහා භාවිත කළ රෙදි කැබැල්ලක දිග සොයන්න.